# 17. අන් අයගේ වුවමනාවට මුල් තැන දෙමු

අප එකිනෙකා අන් අයගේ වුවමනාවට මුල් තැන දිය යුතුයි. කෙනකුට යම් දෙයක් අවශ්‍ය වේ. ඒ වෙලාවේ දී ම එම දෙය තවත් කෙනකුට ද අවශ්‍ය වේ. මේ වේලාවේ තම වුවමනාව ගැන නොසලකා අනෙකාගේ වුවමනාව ඉටු කළ යුතු ය. අන් අයගේ වුවමනාවට මුල් තැන දීම මෙයින් කියැවේ. මෙය පරිත්‍යාගශීලීභාවය කියාත් හැඳින්විය හැකි ය.

මේ සඳහා එක්තරා සිද්ධියක් ඉස්ලාමීය ඉතිහාසයෙන් උදාහරණ වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

එක්තරා යුද්ධයක දී පිරිසක් මිය ගොස්, පිරිසක් තුවාල ලැබූහ. ඒ අයට උදවු කිරීමට තවත් පිරිසක් එහි ගියහ. ඒ අයගෙන් කෙනකු ළඟ දිය බඳුනක් තිබුණේ ය.

ඒ අවස්ථාවේ දී එක් තැනැත්තෙක් වතුර, වතුර යයි කියමින් කෙඳිරි ගෑවේ ය. ඒ හඬ ඇසුණු වහා ම ඔහු දිය බඳුන සමග එතැනට ගියේ ය. පිපාසයෙන් පෙළුණු තැනැත්තාට ඔහු වතුර පෙවීමට සූදානම් වන විට, "වතුර" යනුවෙන් තවත් කෙනකු කියන හඬ ඇසුණි. එවිට එම තැනැත්තාට දිය පොවා එන ලෙසට පළමු තැනැත්තා සංඥාවක් කළේ ය. ඔහු වහා ම දෙවැන්නා වෙත දිය බඳුන සමඟ දිව ගියේ ය. දිය පෙවීමට සූදානම් වන විට, තවත් කෙනකුගේ හඬ ඇසුණි.

එය ඇසුණු දෙවැන්නා ඔහුට දිය පොවන ලෙස සංඥා කළේ ය. දිය බඳුන රැගෙන ආ තැනැත්තා තුන්වැන්නා ළඟට දිව ගියේ ය. ඒ සොහොයුරාට දිය පෙවීමට පෙර ම ඔහු මිය ගියේ ය. වහා ම ඔහු දෙවැන්නා ළඟට දිව ගියේ ය. ඔහු ද මිය ගොස් සිටියේ ය. ඉන් පසු පළමු වැන්නා වෙත දිව ගියේ ය. ඔහුත් මිය ගොස් සිටින බව දුටුවේ ය. තිදෙනා ම වතුර නො බී මරණයට පත් වූහ.

දරුවනි, තමා මැරෙන මොහොතේ දී පවා අපේ මුතුන්මිත්තෝ තමාට වඩා අන් අය වැදගත් කොට සැලකූහ. අපි ද අන් අය වෙනුවෙන්, අපගේ වුවමනාවට වඩා, අන් අයගේ වුවමනාව ඉටු කිරීමට පුරුදු වෙමු.

## පැවරුම්

**A කොටසේ දී ඇති වැකි කොටස්වලට ගැළපෙන වැකි කොටස් B කොටසෙන් තෝරා ගළපා අභ්‍යාස පොතේ ලියන්න.**

| A | B |
|---|---|
| 1. එක්තරා යුද්ධයක දී | 1. සූදානම් විය. |
| 2. තවත් කෙනකුට එම දේ ම | 2. අන් අයට සැලකූහ. |
| 3. පිපාසයට ජලය පොවන්නට | 3. අවශ්‍ය විය. |
| 4. මැරෙන මොහොතේ දී පවා | 4. මරණයට පත් වූහ. |
| 5. තිදෙනා ම ජලය නො බී | 5. කොටසක් මිය ගියහ. |